අද 2019. 08. 26

# අපේ ඉලක්කය වන්නේ 2025 වනවිට මේ රටේ උදාගම්මාන 20,000ක් ඉදිකිරීමයි

## - නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සජිත් ප්‍රේමදාස

**සූරියවැව - නුවන් ජයසේකර**

ඒක් පවුලකට මාසයක් ජීවත් වීම සඳහා අවම වශයෙන් රුපියල් පනස් පන්දහසක මුදලක් අවශ්‍ය බව රජයේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසන බවත්, තමන් ජනාධිපති ලෙස පත් කරන විට 51%ක් වන කාන්තා පරපුර මේ රටේ ආදායම් උපයන ලක්ෂපතිනියන් කෝටිපතිනියන් බවට පත්කර මේ රටේ පවුල් ලක්ෂ 61ටම යහපත් උසස් ජීවන මට්ටමකින් යුත් ජනජීවිතයක් උදාකර දෙන බවද නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතා පැවසීය.

හෙතෙම මේ බව පැවසුවේ, පෙරේදා (24) සූරියවැව වැදිවැව ඉදිවූ 260 වන උදා ගම්මානය වූ 'සිතුපියමග' හා 261 වන වන උදාගම්මානය වූ 'සහස්පත්ගම' ජනතා අයිතියට පත් කිරීමේ අවස්ථාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා මෙසේද පැවසීය.

"අපේ රටේ පවුල් ලක්ෂ 61ක් ඉන්නවා. පුරවැසියන් විදියට ගත්තොත් ලක්ෂ දෙසිය විස්සක් ඉන්නවා. මේ ඉන්න අයගෙන් මාසෙකට කීදෙනයිද හරියට මේ කියන මුදල උපයන්නේ. ආහාර හා ආහාර නොවන වියදම් ඇතුළුව පවුලකට මාසෙකට ජීවත් වෙන්න ඕන අඩුම මුදල ගැන. ඒ අනුව බැලුවාම බලන්න කීදෙනෙක් ඉන්නවද මේ කියන ඉලක්කය සපුරපු පවුල්. මේ වෙනකොට කීදෙනෙක් නම් ණයකාරයෝ වෙලාද. කීදෙනෙක් නම් රත්‍රං බඩු උගස් තියලද, කී දෙනෙක් නිවස උගසට තියලද. මේ ගැන අපි හිතලා බලනකොට අපිට ඉතාමත් කනගාටුදායක චිත්‍රයක් තමයි මැවෙන්නේ. ඒ කියන්නේ මෙතෙක් හිටපු කණ්ඩායම් වගේම පුද්ගලයින් ජනතාව කෙරෙහි දැක්විය යුතුව තිබූ සැලකිල්ල දක්වලා නෑ කියන එකයි. ජනතාවගේ ජීවන ප්‍රශ්නය විසඳන්න කටයුතු කර නෑ කියන එකයි මොන පැත්තෙන් බැලුවත් පේරෙන්නේ. නමුත් මං තමුන්නාන්සේලාට පොරොන්දු වෙනවා මේ නොවැම්බර්, දෙසැම්බර් මාස වනවිට ඔබ එකතුවෙලා මාව මේ රටේ ඉහළම තැනට ගෙනියන්න කටයුතු කළොත් මේ සියලුම දෙනාගේ ජනජීවිත උසස් කිරීමට අවශ්‍ය සියලුම පියවර ගන්නා බවට.




අපි මේ රජය ආරම්භ කරලා මේ කෙටි කාලය තුළ වැඩසටහන් රාශියක් ආරම්භ කළා. ඒ අතරින් එකක් තමයි මේ ජාතික නිවාස වැඩසටහන. අපේ ඉලක්කය වන්නේ 2025 වනවිට මේ රටේ උදාගම්මාන 20,000ක් ඉදිකිරීමයි. එහි මුල් අදියරවූ උදාගම්මාන 2500 ඉලක්කය සම්පූර්ණ වෙන්න තිබුණේ එළඹෙන සැප්තැම්බර් මාසේ අග වනවිට. නමුත් අපේ අධිකාරියේ දක්ෂ නිලධාරීන්ගේ කැපවීම නිසා පසුගිය ජූනි 15 වෙනිදා වෙනකොට ඒ ඉලක්කය සම්පූර්ණ කළා. මේ වෙනකොට ලංකාව පුරා උදාගම්මාන 2553ක් ඉදිකරගෙන යනවා. මේ නිවාස ව්‍යාපෘතිය දියත් කෙරෙන්නේ පන්සල් වෙහෙර විහාර, පාලම්, බෝක්කු ඇතුළු අනෙකුත් සංවර්ධන කටයුතුවලට අමතරවයි කියන එකත් මතක් කරන්න ඕනේ. දෙවෙනි තුන්වෙනි හා හතරවෙනි අදියර යටතේ තවත් උදාගම්මාන 17,500ක් හදන්න. හැබැයි ඒ උදාගම්මාන 17,500 අපි ක්‍රියාත්මක කරන්න යන්නේ උදාගම්මාන මහල් නිවාස ව්‍යාපෘතීන් විදියටයි. ඒ කියන්නේ තට්ටු නිවාස ව්‍යාපෘතියි ඉදිකරන්න යන්නේ. ඒකට හේතුව තමයි මේ වටිනා ඉඩම් සම්පත කළමනාකරණය කළ යුතු නිසා. ඒ නිසා මේ ජනතාවට මං දෙන තව එක් පොරොන්දුවක් තමයි මේ ජනතාවගේ ආශිර්වාදය ඇතිව 2025 වනවිට මේ රටේ උදාගම්මාන 20000 ඉදිකරලා මේ රටේ නිවාස නැති සියලුම දෙනාගේ නිවාස සිහිනය සැබෑ කරනවා කියන පොරොන්දුවත් අද මන් තමුන්නාන්සේලාට දෙනවා." යැයි පවසා සිටියේය.

මෙම අවස්ථාවට ධීවර හා ජලජ සම්පත් රාජ්‍ය අමාත්‍ය දිලිප් වෙදආරච්චි මහතා ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.



